කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (ගෞරව) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2024

2026 - අප්‍රේල්

**BCOM 18025 - සූක්ෂම ආර්ථික විද්‍යාව**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : හතයි (07) කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

## ප්‍රශ්න අංක 01

අ) ආර්ථික විද්‍යාව නිර්වචනය කර, සමාජ විද්‍යාවක් ලෙස එහි ස්වභාවය විස්තර කරන්න.

**(ලකුණු 04)**

ආ) හිඟකම (Scarcity) යන සංකල්පය විස්තර කර, එය ඕනෑම සමාජයක මූලික ආර්ථික ගැටළුව ලෙස සැලකෙන්නේ ඇයිද යන්න පැහැදිලි කරන්න.

**(ලකුණු 04)**

ඇ) ආවස්ථික පිරිවැය (Opportunity Cost) යනු කුමක්ද? එය ආර්ථික තීරණ ගැනීමේදී බලපාන ආකාරය උදාහරණයක් සමඟ විස්තර කරන්න.

**(ලකුණු 06)**

ඉ) සුක්ෂ්ම ආර්ථික විද්‍යාව (Microeconomics) හා සාර්ව ආර්ථික විද්‍යාව (Macroeconomics) අතර වෙනස උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

**(ලකුණු 06)**

**(මුළු ලකුණු 20)**

## ප්‍රශ්න අංක 02

අ) ඉල්ලුම් න්‍යාය හා සැපයුම් න්‍යාය උදාහරණ සමඟ විස්තර කරන්න.

**(ලකුණු 04)**

ආ) පහත දැක්වෙන ආකාරයෙන් භාණ්ඩයක ඉල්ලුම් සහ සැපයුම් සමීකරණ ලබා දී ඇත.

$$Q_d = 100 - 5P$$
$$Q_s = 20 + 3P$$

සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය සොයන්න.

**(ලකුණු 04)**

ඇ) රජය විසින් එක් ඒකකයක් සඳහා රු. **2** ක බද්දක් පැනවූ විට, සැපයුම් සමීකරණය පහත පරිදි වෙනස් වේ.

$$Q_s = 20 + 3(P - 2)$$

i. නව සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය සොයන්න.

**(ලකුණු 04)**

ii. පාරිභෝගිකයින් සහ නිෂ්පාදකයින් මත වන බද්දේ භාරය ගණනය කරන්න.

**(ලකුණු 04)**

ඉ) මුල් ඉල්ලුම් සමීකරණය භාවිතා කරමින්, මිල රු.10 සිට රු.12 දක්වා වෙනස් වූ විට, මධ්‍ය ලක්ෂ්‍ය (Arc) ක්‍රමය භාවිතා කරමින් මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කරන්න.

(ලකුණු 04)
(මුළු ලකුණු 20)

## ප්‍රශ්න අංක 03

අ) උපයෝගීතාවය (Utility) නිර්වචනය කර, මුළු උපයෝගීතාවය (Total Utility) හා ආන්තික උපයෝගීතාවය (Marginal Utility) අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ) පහත වගුවෙන් පාරිභෝගිකයෙකු භාණ්ඩයක එක් එක් ඒකකය පරිභෝජනය කිරීමෙන් ලැබෙන මුළු උපයෝගීතාවය (TU) පෙන්වයි.

| ඒකක ගණන | මුළු උපයෝගීතාව |
|---|---|
| 1 | 10 |
| 2 | 18 |
| 3 | 24 |
| 4 | 28 |
| 5 | 30 |

i. එක් එක් ඒකකය සඳහා ආන්තික උපයෝගීතාව ගණනය කරන්න.
ii ඉහත දත්ත භාවිතා කර, මුළු උපයෝගීතා හා ආන්තික උපයෝගිතා වක්‍ර අඳින්න.

(ලකුණු 04)

ඇ) පාරිභෝගික සමතුලිතතාව (Consumer Equilibrium) යනු කුමක්ද? පහත අවස්ථා සඳහා පාරිභෝගික සමතුලිතතා කොන්දේසි පැහැදිලි කරන්න.

i. එක් භාණ්ඩයක් සඳහා

ii. භාණ්ඩ දෙකක් සඳහා (සම-සමානුපාතික නියමය / Equi-marginal principle)

(ලකුණු 04)

ඉ) උපේක්ෂා වක්‍රවල ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කර, පාරිභෝගික හැසිරීම විශ්ලේෂණය කිරීමට උපකාරී වන ආකාරය උදාහරණ සමඟ විස්තර කරන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 20)

## ප්‍රශ්න අංක 04

අ) යෙදවුම් සහ නිමවුම් අතර සම්බන්ධතාවය අවධාරණය කරමින්, නිෂ්පාදන න්‍යාය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ) ප්‍රායෝගික උදාහරණයක් භාවිතා කරමින්, සම නිෂ්පාදන වක්‍ර ඡේදනය විය නොහැක්කේ මන්දැයි විස්තර කරන්න.

(ලකුණු 05)

ඇ) කෙටිකාලීන සහ දිගු කාලීන නිෂ්පාදනය අතර වෙනස පැහැදිලි කරන්න

(ලකුණු 05)

ඉ) සමාගම් එහි දෛනික මෙහෙයුම් වලදී නිෂ්පාදන න්‍යාය යොදන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

## ප්‍රශ්න අංක 05

අ) i. නිෂ්පාදනයේ ස්ථාවර පිරිවැය සහ විචල්‍ය පිරිවැය අතර වෙනස හඳුනා ගන්න.

**(ලකුණු 05)**

ii. "ආයතනයක අමතර ඒකකයක් නිෂ්පාදනය කිරීමෙන් මුළු පිරිවැය රු.10,000 සිට රු. 10,300 දක්වා වැඩිවිය ".

ආන්තික පිරිවැය නිර්වචනය කර, ප්‍රශස්ත නිෂ්පාදන මට්ටම තීරණය කිරීමේදී එහි වැදගත්කම පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**

ආ) i. ඒකාධිකාරය සැමවිටම ආර්ථික සුභසාධනයට අහිතකරද? සැබෑ ලෝක උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**

ii. ඒකාධිකාරිවරයා ලාභ උපරිම කරන නිමැවුම් මට්ටම සහ මිල තීරණය කරන ආකාරය පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**
**(මුළු ලකුණු 20)**

## ප්‍රශ්න අංක 06

අ) පූර්ණ තරඟකාරී වෙළඳපොළක් නිර්වචනය කර, ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න.

**(ලකුණු 06)**

ආ) පූර්ණ තරඟකාරී වෙළඳපොළක: පහත තත්වයන් දී ඇත.

වෙළඳපොළ මිල (P) = රු. 50

මුළු පිරිවැය: $TC = 100 + 10Q + Q^2$

i. ආන්තික පිරිවැය (MC) සොයන්න

ii. ලාභ උපරිම කරන නිමැවුම තීරණය කරන්න

iii. මුළු ආදායම (TR) ගණනය කරන්න

iv. මුළු ලාභය සොයන්න

**(ලකුණු 08)**

ඇ) "පූර්ණ තරඟකාරිත්වය ආර්ථිකයේ උපරිම කාර්යක්ෂමතාවයට මග පාදයි." මෙම ප්‍රකාශය විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න.

**(ලකුණු 06)**

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 07**

අ) ඒකාධිකාරී තරඟය, ප්‍රායෝගික උදාහරණ දෙකක් භාවිතා කරමින් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ) ඒකාධිකාරී තරඟය පරිපූර්ණ තරඟයට වඩා අඩු කාර්යක්ෂම ලෙස සලකන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ) පහත ලක්ෂණ සම්බන්ධයෙන් ඒකාධිකාරී තරඟය සහ කතිපයාධිකාරී සංසන්දනය කරන්න.

- ආයතන ගණන
- නිෂ්පාදන වර්ගය
- ඇතුළුවීමට ඇති බාධක

(ලකුණු 06)

ඉ) කතිපයාධිකාරී වෙළඳපොළ ව්‍යුහයක, ආයතන අතර අන්තර් රඳාපැවැත්ම බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04)
(මුළු ලකුණු 20)